මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 15/10/2019

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**Human Rights Commission of Sri Lanka**


සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
සරණ පාර,
රාජගිරිය.

ගරු සභාපතිතුමනි,

**ඡන්දපොළ මධ්‍යස්ථාන පිහිටුවන ස්ථාන පිළිබඳ බලධාරී පුද්ගලයින් වෙතින් ඡන්දය භාවිතා කිරීම සඳහා පැමිණෙන ඡන්ද දායකයින් වෙත සිදුවන බලපෑම් තුරන්කිරීම**

2019 ජනාධිපතිවරණයේදී ද ශ්‍රී ලාංකීය ජනතාවට ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන වගන්තිය මඟින් පිළිගත් ජනතා පරමාධිපත්‍ය උරගාබැලීම සඳහා අවස්ථාව උදාවී ඇත. ඒ අනුව පුරවැසියන්ට හිමි ඡන්දය භාවිතා කිරීම සඳහා අවස්ථාව සලසන මැතිවරණ වලදී "කිසිවෙකුත් ඉන් අත් නොහැරෙන මැතිවරණයක් තහවුරු කිරීම" යන්න පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ අතිවිශේෂ අවධානයක් යොමුවී ඇත.

ඡන්දපොළ මධ්‍යස්ථාන පිහිටුවන ස්ථාන පිළිබඳ බලධාරී පුද්ගලයන්/පාර්ශවයන් වෙතින් ඡන්දය භාවිතා කිරීම සඳහා පැමිණෙන ඡන්ද දායකයින් වෙත බලපෑම් සිදුවන තත්වයක් ඇතිවන අවස්ථා පිළිබඳව සිද්ධීන් පසුගිය මැතිවරණ වලදි වාර්තාවී ඇත. විශේෂයෙන්ම ආගමික හෝ වාර්ගික වැනි සුවිශේෂි කණ්ඩායම්වලට හෝ වෙනත් සුවිශේෂි වූ ප්‍රජාවන්ගේ භාරයේ ඇති (උදා : ආගමික සිද්ධස්ථාන, ප්‍රජා ශාලා) ස්ථානවල ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීමේ දී අදාළ ස්ථානයන්හි ප්‍රධානීන් වෙතින් ඡන්ද දායකයින් වෙත බලපෑම් සිදුකිරීමේ ප්‍රවනතාවයක් නිරීක්ෂණය වී ඇත. ඒ අනුව ඡන්දපොළ පිහිටුවීමේ දී ඡන්ද භාවිතා කරන ඡන්ද දායකයින්ට බලපෑමක් සිදුනොවන, සියල්ලන්ටම පොදු වූ ස්ථාන තෝරාගැනීමට කටයුතු කිරීම අතිශයින් වැදගත් වේ. එහිදී පහත අංශ කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන්නෙමු:

- ඡන්ද මධ්‍යස්ථානයක් ලෙස හැකි සෑම විටකදීම සියල්ලන්ටම පොදු වූ ස්ථානයක් තෝරාගැනීම.
- වෙනත් විකල්පයක් නොමැතිව ආගමික හෝ වාර්ගික වැනි සුවිශේෂි කණ්ඩායම්වලට හෝ වෙනත් සුවිශේෂි වූ ප්‍රජාවන්ගේ භාරයේ ඇති ස්ථානයක් තෝරාගත් විට අදාළ ස්ථානයන්හි ප්‍රධානීන් වෙතින් ඡන්ද දායකයින් වෙත සිදුවන බලපෑම තුරන්කිරීම සඳහා විධි විධාන යොදා ගැනීම.


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com

- ආගමික හෝ වාර්ගික වැනි සුවිශේෂී කණ්ඩායම්වලට හෝ වෙනත් සුවිශේෂී වූ ප්‍රජාවන්ගේ භාරයේ ඇති ස්ථානයකදී ඡන්දය පවත්වන විටක තම ඡන්දය භාවිතා කිරීමට ඡන්දපොළ පිහිටීම බාධාවක් නොවන බව ඊට අදාළ ඡන්ද දායකයින් වෙත ග්‍රාම නිලධාරීන් හරහා දැනුවත් කිරීම.

ශ්‍රී ලාංකීය පුරවැසියන්ට නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය සඳහා දායකවීමට පවතින මූලිකම අවස්ථාව වන සර්වජන ඡන්ද බලය භාවිතා කිරීමට රට තුළ සිටින සියළු පුරවැසියන්ට අවස්ථාව තහවුරු කිරීමට මින් පිටිවහලක් සිදුවනු ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ සක්‍රීය මැදිහත්වීම අපේක්ෂා කරන්නෙමු.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lank

ආචාර්ය දීපිකා උඩගම,
සභාපතිනිය,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2019 ඔක්තෝම්බර් මස 15